# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012-05-31

වේලාව : පෙ.ව.09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රුමී මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07.ගරු නාගරික මන්ත්‍රී | ඒ.අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජේ.මලීක්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. එම්.එච්.සීලවතී මිය | ලේකම් |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2012 වර්ෂයේ මැයි මාසයට අදාළ මහා සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බැව් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වු ගරු සභාපතිතුමා ගම නැගුම වැඩ සටහන යටතේ " එක් ගමකට එක් වැඩක" යන තේමා පාඨය මුල්කරගෙන මේ වන විට මෙම ප්‍රදේශයේ සෑම ග්‍රාම නිලධාරී වසමකම වැඩ ආරම්භ කර ඇති අතර, අද දින බළන්ගොඩ නගර වසමේ බෝමිඹුව ප්‍රදේශයේ ප්‍රජාශාලාවක් ඉදිකිරීම සහ නිල්වලා ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා ද මුල්ගල තැබු බැව් පැවසීය. මේ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලක්ෂ 10 ක මුදලක් ලැබී ඇති අතර, මෙම ප්‍රජාශාලාවේ ග්‍රාම නිලධාරී කාර්යාලයක්/සමෘද්ධි සංවර්ධන නිලධාරී කාර්යාලයක් හා සෞඛ්‍ය මධ්‍යස්ථානයන් ස්ථාපිත කිරීමට අදහස් කරන බවද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

තම තමන් නියෝජනය කරනු ලබන ප්‍රදේශවල සංවර්ධන කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා කටයුතු කරන ලෙස ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින බව පවසමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2012.04.30 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම**

පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම** :

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරන ලදී.

06. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

**06:01 " සොබා " 2012 " ලෝක පරිසර දින සැමරුම් ජාතික ප්‍රදර්ශනය**

උක්ත කරුණට අදාළව මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති චරිත් හේරත් මහතා විසින් එවා ඇති 2012-04-14 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2012 ජුනි මස 05 වන දිනට යෙදී ඇති ලෝක පරිසර දිනය නිමිත්තෙන් මධ්‍යම පරිසර අධිකාරිය හා පරිසර අමාත්‍යාංශය එක්ව " හරිත ආර්ථිකය : ඔබත් එහි කොටස්කරුවෙකි " යන තේමාවට අදාලව සැකසූ විශේෂාංග ඇතුළත් ජාතික සැමරුම් උත්සවය ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ හා ගරු පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ රාජකීය විද්‍යාලයේ දී ජුනි මස 05 වන දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින්, මෙම පාරිසරික ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ආයතන වෙනුවෙන් නොමිලේ 10'x10' 20'x10' හෝ 20'x20' ප්‍රමාණයේ ප්‍රදර්ශන කුටි ලබාදීමට හැකියාවක් පවතින බැවින්, ඒ සඳහා ඉදිරිපත්වන්නේ නම් අදාල අයදුම්පත පුරවා එවන ලෙස එමගින් දන්වා තිබිණ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාල ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:02 **සඟරා මිළදී ගැනීම :**

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා මිළදී ගන්නා (Time) ටයිම්ස් සඟරාවේ දායකත්වය අලුත්කරන ලෙස අදාල ආයතනයෙන් ඉල්ලීමක් කර ඇති බැවින්, වසරක කාලයක් සඳහා අදාල දායක මුදල ගෙවා ටයිම්ස් සඟරාව ලබාදෙන ලෙස ඉල්ලා බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල දායක මුදල ගෙවා ටයිම්ස් සඟරාව මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:03 **වරිපනම් අංක ලබාදීම හා තක්සේරු ලේඛනයේ නම සංශෝධනය කිරීම :**

ඉහත සදහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2012-05-25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වරිපනම් අංක ලබාදීම හා තක්සේරු ලේඛනයේ නම සංශෝධනය කිරීම සඳහා භාර දී ඇති ඔප්පු ලුහුඬු පිටපත් නිවැරදිව පරීක්ෂාකර බලා අනුමත කර තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකරන ලද ඔප්පු ලුහුඬු පිටපත් සියල්ල විවිධ අඩුපාඩු පෙන්වා දෙමින් ආපසු එවන බවත්, මෙම අඩුපාඩු පිළිබඳව මහජනතාව දැනුවත් කල විට ඔවුන් සභාවට දෝෂාරෝපණය කරන බැවින්, මේ සම්බන්ධව සලකා බලා සුදුසු තීරණයක් ගන්නා ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ඉහත සඳහන් හේතුව නිසා පාරිභෝගික ජනතාව අපහසුතාවකට ලක්වන බැවින්, මීට පෙර සංශෝධන කටයුතු කල පරිදි මෙම කාර්යාලයෙන් අදාල සංශෝධනයන් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:04 **පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්ගේ රාජකාරී ගමන් බිමන් සඳහා යොදාගන්නා යතුරු පැදි සඳහා ඉන්ධන දීමනාවක් ලබාදීම.**

ඉහත සඳහන් කරුණට අදාලව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2012-05-29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින් විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යොමු කරන ලද ඉල්ලීම පිළිබඳව සලකා බලා එතුමා විසින් සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සඳහා මාසිකව ඉන්ධන දීමනාවක් ගෙවීමට අනුමත කර ඇත.

ඒ අනුව මෙම දීමනාව පහත සඳහන් කොන්දේසි වලට අනුව උපරිමය රු.5000/- ක සීමාවකට යටත්ව ගෙවීම අනුමත කරන ඇත.

1. මෙම දීමනාව රු.5000/- ක උපරිම සීමාවකට යටත්ව ගෙවිය හැකි අතර, දැනට සභාව සතු මූල්‍ය හැකියාව අනුව ඒ ඒ සභා විසින් සභා තීරණයක් ගෙන ගෙවනු ලබන දීමනාවේ සීමාව තීරණය කරගත යුතුය.

2. මෙම දීමනාව ගෙවනු ලබන දිනය තීරණය වනුයේ ඒ ඒ සභාව විසින් ගෙවීම සඳහා තීරණය කරනු ලබන දිනයට පසුව එළඹෙන දිනක සිටය.

3. සෑම සභාවකම නගරාධිපතිවරුන් හා සභාපතිවරුන් හැර සියලු මහජන නියෝජිතයින් සඳහා මෙම දීමනාව ගෙවිය හැක.
4. මෙම දීමනාව අදාළ මහජන නියෝජිතයා සතුව තිබෙන ඕනෑම වර්ගයේ වාහනයක් සඳහා ගෙවිය හැක.

5. දීමනාව ගෙවීමේ දී අදාල වාහනය අදාල මහජන නියෝජිතයා සතුව පවතින එකක් බවට තහවුරු කරග යුතුය. මේ සඳහා වාහනයේ ලියාපදිංචි අදාල මහජන නියෝජිතයා සතුව තිබිය යුතු බවට තහවුරු කරගත යුතුය.
6. දීමනාව ගෙවීමේ දී පළමුව අත්තිකාරමක් ලබා දී පසුව එය ප්‍රතිපූර්ණය කරගැනීමේ පදනම මත ගෙවිය යුතුය.

7. මෙම දීමනාව ගෙවීමේ දී සභාව සම්බන්ධව රාජකාරී කටයුත්තක් සඳහාම අදාළ වාහනය යෙදවූ බවට තහවුරු කරගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කරගත යුතුය.
8. මේ සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන ඉදිරියට සලසා ලත යුතු අතර , එතෙක් සභාව සතු අරමුදලින් මෙම දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කරගත යුතුය.

සභාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සලකා රු.3000/- ක මුදලක් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:05 **සේවා ගිවිසුමක් මත පුස්තකාල සහායකයන් ලබාගැනීම :**

ඉහත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී. බළන්ගොඩ මහජන පුස්තකාලයේ සේවයේ නියුතු පුස්තකාල සහායක මහත්මීන් දෙදෙනෙකු ඒ සඳහා ඉල්ලීම් කර ඇත.

පුස්තකාලයාධිපතීන් බඳවා ගැනීමේ කටයුතු ඉක්මණින් සිදුකෙරෙමින් පවතින නිසා එම මහත්මීන් දෙදෙනා උසස්වීම් ලබාගියහොත් පුස්තකාලයේ එදිනෙදා රාජකාරී කටයුතු කරගෙන යාමට අපහසු තත්ත්වයක් ඇතිවිය හැකි බැවින්, ඒ වෙනුවට ආදේශක පුස්තකාල සහායකයින් දෙදෙනෙකු ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

පුස්තකාල සහයකයින්ට උසස්වීම් ලැබීමෙන් පසු පුස්තකාල සහයකයින් ලෙස පිරිමි ළමයින් දෙදෙනෙකු සේවා ගිවිසුමක් මත බඳවා ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:06 **පොදු වෙළඳසැල අංකඃ 03 කඩ කාමරය :**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ, බුලත්ගම , වැවේවත්ත " උබයසිරි " යන ලිපිනයේ පදිංචි ඩී.එම්.චන්ද්‍රා උබයසේකර මහත්මිය විසින් එවා ඇති 2012-05-30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පොදු වෙළඳසැල අංකඃ 03 කඩ කාමරය සේන උබේසේකර මහතා විසින් පවත්වාගෙන ගිය අතර, ඔහු 2012-04-27 දින මියගිය බැවින් එම කඩයේ අයිතිය ඔහුගේ නීත්‍යානුකූල විවාහක බිරිඳ වන ඩී.එම්.චන්ද්‍රා උබයසේකර සහ පුතා වන ලලිත් උබයසේකර යන අයට පවරාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධයෙන් සලකා බැලූ සභාව, මිය ගිය අයගේ පුතකු වන ලලිත් අශෝක උබයසේකර මහතා ද ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින්, මෙම දෙදෙනාම කාර්යාලයට කැඳවා දෙදෙනාගේ එකඟතාවය ලබාගෙන අදාල කටයුතු සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:07 **City net Mayos Meeting Towards the 5th Asian Ministerial Conference on Disaster Risk Reduction in Surabaya, Indonesia ,10 July 2012 and the International Seminar on Sharing Experience on Disaster Risk Reduction and Climate Change Adaptation in Sitoarjo, in donesia, 13 July 2012 ජාත්‍යන්තර සමුළුවට සහභාගීවීම සඳහා නිවාඩු අනුමත කරගැනීම සහ ගුවන් ටිකට්පත් සඳහා අත්තිකාරම් මුදලක් ලබාගැනීම :**

උක්ත කරුණට අදාළව UNISDR ආයතනයේ පරිසර සංරක්ෂණය කරන නගරයන්ගේ සමුළුවට සහභාගීවීම සඳහා එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල සමුළුව ඉන්දුනීසියාවේ සුරබයා හි දී 2012 ජුලි මස 09 වන දින සිට 12 දින දක්වා පැවැත්වීමට නියමිත බව එමගින් දන්වා ඇත. මෙම වැඩ මුළුවට සහභාගීවන ලෙස ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාට හා මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්.ජ්.එන්.ප්‍රේමතිලක මහතාට ආරාධනා කර ඇති බැවින්, එම කාලයට නිවාඩු අනුමත කරදෙන ලෙසත්, ගුවන් ටිකට්පත් සඳහා වැයවන මුදල සඳහා අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙසත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉල්ලීමක් කර තිබුණි.

ගුවන් ටිකට්පත් සඳහා වැයවන මුදල සහා අරමුදලින් අත්තිකාරමක් වශයෙන් ලබාදීමටත්, අදාල කාලවකවානුව සඳහා ගරු සභාපතිතුමාට හා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට නිවාඩු අනුමත කිරීමටත් මේ සඳහා පළාත් පාලන කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගැනීමටත් සභාව තීරණය කරන ලදී.

06:07 **පෙර නිමි තාර මිශ්‍රණ කර්මාන්තයේ මිළ වෙනස් කරගැනීම :**

බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පෙර නිමි තාර මිශ්‍රණ කර්මාන්තය කරගෙන යන ආර්.ජී.ගුණපාල යන අයට පෙර නිමි තාර මිශ්‍රණ වඩියකට ගෙවනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බැවින්, වඩියකට රු.125/- බැගින් මුදල් ගෙවන ලෙස ඉල්ලා, ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පෙර නිමි තාර වඩියකට රු.100/- බැගින් මුදල් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:08 **ඉරිදාපොලේ මඩුවලින් පිටපත වෙළඳාම් කරන අයට ඉඩකඩ ලබාගැනීම**

බළන්ගොඩ ගැමුණු සුභ සාධක එළවළු වෙළඳුන්ගේ සමිතියේ සාමාජිකයින් 31 ඉරිදා පොලේ මඩුවලට පිටතින් වෙළඳාම් කරන බැවින්, ඔවුන් ඉවත් කිරීමට නගර සභාව මගින් තීරණයක් ගෙන ඇති නිසා ඔවුන්ට අසාධාරණයක් වන බැවින්, ඉඩකඩ ඇති පරිදි මඩුවල වෙළඳාම් කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස එම සමිතියේ සභාපති විසින් ඉල්ලීමක් කර තිබුණි.

දැනට හිස්ව ඇති මඩු එම වෙළදුන්ට ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- ඉරිදා පොලේ ඇති සමහර වෙළඳකුටි වෙළඳාම් නොකර වෙනත් අය විසින් බලය තහවුරු කරමින් අයුතු ප්‍රයෝජන ගන්නා බවට තොරතුරු හෙළි ඇති බැවින්, එම වෙළඳකුටි ලියාපදිංචිකර මාස්පතා කුළියක් අයකරන ලෙසත් ඉරිදා පොලේ සාමාජිකයින්ගේ සමිති කටයුතු ආදිය පවත්වාගෙන යාම සඳහා අංකඃ 18 දරණ වෙළඳ කුටිය ගැමුණු සුභ සාධක එළවළු වෙළඳුන්ගේ සමිතියට පවරාදෙන ලෙසත් ඉල්ලා තිබිණ. මෙම කාරණා සම්බන්ධව ආදායම් පරීක්ෂක මහතා වෙතින් වාර්තාවන් ලබාගැනීමට තීරණය කරන ලදී.

- ඉරිදා පොල පිළිබඳව පවතින ගැටළු සාකච්ඡා කිරීම සඳහා එම සමිතියේ නිලධාරීන් කිහිප දෙනෙකුට මහා සභා රැස්වීමකට සහභාගීවීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලා ගැමුණු සුභ සාධක එළවළු වෙළඳුන්ගේ සමිතියේ ලේකම් විසින් ඉල්ලා තිබිණ. මීළග මහා සභා රැස්වීමට සහභාගීව වන ලෙස දැණුම්දීමට සභාව තීරනය කරන ලදී.

07. **මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම් )**

රු.10000/- ට වැඩි ගෙවීම් 2012-05-21 වන දින පැවති මුදල් කමිටුවේ දී අනුමත කර ඇති බව සභාවට වාර්තා කර තිබුණි.

08. **ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් නොවීය.

09. **ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම**

09:01 **RC – 1107 ට්‍රැක්ටරයට ටයර් 02 ක් ලබාගැනීම :**

සභාවට අයත් ඉහත අංක දරණ ට්‍රැක්ටරයට ටයර් 02 ක් මිළඳී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කර තිබුණි.

| ජයන්ති ටයර් සෙන්ටර් | පී.එස්.ටයර් වර්ක්ස් | බළන්ගොඩ ටයර් සර්විස් |
|---|---|---|
| රු.22400/- | රු.21800/- | රු.22000/- |

මෙම මිළ ගණන් අතුරින් පී.එස්.ටයර් වර්ක්ස් ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 **N.D.5124 වෑන් රථයට අමතර කොටස් මිළදී ගැනීම**

මෙම සභාව සතු ඉහත අංක දරණ වෑන් රථයට අමතර කොටස් මිළඳී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර, එම මිළ ගණන් පහත දැක්වේ.

| නැෂනල් මෝටර්වේස් | ජයසිරි ඔටෝ | තෙබුවන |
|---|---|---|
| රු.15600/- | රු.14000/- | රු.18000/- |

ඉහත මිළ ගණන් අතුරින් ජයසිරි ඔටෝ ආයතනයේ අවම මිළ පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:03 **G.k 1483 ට්‍රැක්ටර්ට ටයර් ලබාගැනීම :**

මෙම සභාවට අයත් G.K.1483 ට්‍රැක්ටරයට ටයර් 02 ක් මිළඳී ගැනීම සඳහා ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ජයන්ති ටයර් සෙන්ටර් | පී.එස්.ටයර් වර්ක්ස් | බළන්ගොඩ ටයර් සර්විස් |
| රු.27000/- | රු.26500/- | රු.26800/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ඉදිරිපත් කර ඇති පී.එස්.ටයර් වර්ක්ස් ආයතනයේ අවම මිළ පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ** : නැත

11. **යෝජනා**

11:01 **ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:**

මෙම නගර සභාව මගින් පාලනය වන වැව්වෙත්ත පෙර පාසලේ පාළිකාවන්ට ගෙවනු ලබන දීමනාව වැඩිකිරීම හා අලුතින් තවත් එක් පෙර පාසල් පාළිකාවක් බඳවා ගැනීමමට යෝජනා කල අතර. එම යෝජනාව ගරු උපසභාපති ඩබ්.ජී.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පෙර පාසල් පාළිකාවක් බඳවා ගැනීමටත්, ලබන මස සිට රු.6000/ බැගින් දීමනාව ගෙවීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

11:02 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

01. කල්තොට පාරේ ගොරොක්ගහමඩ පල්ලිය ඉදිරිපිට කාණුවට ස්ලැබ් දැමීම.

02. කල්තොට පාරේ කිරිමණ්ඩලය අසලින් යන මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම.

03. මෙම වර්ෂයේ රත්නපුරයේ පැවති ජාතික වෙළාඳුන් නබි උත්සවයේ දී බළන්ගොඩ සිද්ධස්ථාන වැඩිදියුණු කිරීම සඳහා මුදල් වෙන්කිරීම පිළිබඳ ස්තුතිය පුදකිරීම.

04. තුඹගොඩ රාස්සගල පාරේ කාණු පද්ධතිය හරියාකාර ඉදිකිරීමක් කර නොමැති නිසා ජලය රැඳීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට එය පිළිසකර කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම.

මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත අංක 01 හා 04 යෝජනාවන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී. අංකඃ 02 හි සඳහන් යෝජනාව පළාත් සභාවෙන් මුදල් ලැබුණු පසු ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

11:03 **ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :**

01. බළන්ගොඩ සතිපොළේ ආදායම අඩු බැවින් කොන්දේසි හා නිර්ණායකයන්ට යටත්ව සතිපොළ ටෙන්ඩර් කිරීම.

සතිපොළෙහි ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බැවින්, සතිපොළ ටෙන්ඩර් කිරීම සුදුසු බවත්, වෙළඳුන්ගෙන් මුදල් අයකිරීමේ දී නිසි පරිදි රිසිට්පතක් නිකුත් නොකරන අවස්ථාවන් තිබෙන බවත් අනාවරණය වී ඇති බැව් පැවසීය.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා කථාකරමින්, කාලෙන් කාලයට මුදල් අඩු වැඩිවීම සිදුවන බවත්, සතිපොළ ටෙන්ඩර් කිරීමෙන් ඒකාධිකාරයක් ඇති වී පාරිභෝගිකයින්ට හා වෙළඳුන්ට අසාධාරණයක් සිදුවිය හැකි බැවින්, මෙම යෝජනාව ක්‍රියාත්මක කල නොහැකි බැව් පැවසීය. සතිපොළ මඩුවල භාණ්ඩ නොදැමීමට ඇතැම් වෙළඳුන් පුරුදු වී ඇති බවත්, එය වළක්වා විධිමත් පරිදි වෙළඳුන් ස්ථානගතකර අදාල මුදල් ක්‍රමවත් පරිදි අයකරගැනීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් පැවසීය.

- බිල් කැඩෙන ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙස ආදායම් පරීක්ෂක මහතාට දැණුම්දීමට සභාව තීරණය කරන ලදී.

- බදාදා දිනයේ දී අමතර පොළක් පැවැත්වීම සුදුසු යැයි ගරු නාගරික මන්ත්‍රී , එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
- 

මේ සම්බන්ධව වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

11:04 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

පල්ලෙකුඹුර පාර ප්‍රිමෙක්ස් යොදා සංවර්ධනය කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:05 **ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

දෙණියකුඹුර මාර්ගයේ පැල ඉනිවැට කපා ඉවත් කරන ලෙස මෙම සභාව මගින් කිහිපවරක් අදාල අයට දැණුම්දුන් නමුත් මෙතෙක් එය ක්‍රියාත්මක නොවන නිසා නැවත ඒ කෙරෙහි අවධානය යොමුකරවීමට යෝජනා කරන ලදී.

2012 දිවි නැගුම වැඩ සටහන යටතේ තුඹගොඩ ග්‍රාම නිලධාරී වසම සඳහා කොම්පෝස්ට් පොහොර ලබාදීම පසුගිය සභාවේ දී අනුමත කල බවත්, පෙහොර සඳහා වැයවන මුදල තමාගේ දීමනාවෙන් අඩුකර හෝ එය ලබාදීමට කටයුතු කරන ලෙස යෝජනා කරන ලදී.

රිෂානා සර්විස් ස්ටේෂන් අසල පාර ඉතිරි කොටස සකස් කරදෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීමක් කර ඇති බැවින්, එම ඉල්ලීම ඉටුකරදෙන ලෙසට යෝජනා කරන ලදී.

මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:06 **ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

දොරවෙල සමාජ සංවර්ධන සමිතියට අඩි 10 ටකරන් 20 ක් ලබාදෙන ලෙසත්, කිරිදිගල කලණ මිතු සුභ සාධක සංගමයට ටකරන් 10 ක් හා ප්ලාස්ටික් පුටු 20 ක් ලබාදෙන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

12. **ආදායම් - වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම.**

2012 වර්ෂයේ අප්‍රේල් මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 5,715,599.98 |
| වෙනත් ලැබීම් | 2,750,643.85 |
| **මුළු ලැබීම්** | **8,466,243.83** |
| පුනරාවර්ථන වියදම් | 4,724,260.12 |
| වෙනත් වියදම් | 6,313,608.06 |
| **මුළු වියදම්** | **11,037,868.18** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

- බළන්ගොඩ නගර සභා තානායමේ 2012-04-01 සිට 2012-04-30 දක්වා වෙළඳ හා ලාභඅලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| විස්තරය | 2012.04.01 සිට 2012.04.30 දක්වා |
|---|---|
| විකුණුම් | 1,036,552.00 |
| **විකුණුම් පිරිවැය** | **657,567,95** |
| දළ ලාභය | 378,984.05 |
| ශුද්ධ ලාභය/අලාභය | 114,999.31 |

මෙම ලාභඅලාභ ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

- 2012.02.28 දින සිට 2012.04.02 දින දක්වාත් 2012.03.31දින සිට 2012.05.01 දින දක්වාත් මෙම සභාව සතු වාහන සඳහා වැය වී ඇති ඉන්ධන පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම ඉන්ධන වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

13. **කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

2012.05.21 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව, 2012.05.21 වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කමිටුවේ වාර්තාව හා 2012.05.21 වන දින පැවති තානායම් කමිටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම වාර්තාවන් සභාව විසින් අනුමත කරන ලදී.

14. **වෙනත් කරුණු :**

14:01 **ගරු නාගරික මන්ත්‍රී, චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින්, සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට යතුරු පැදි ලබාගැනීම හා ඉන්ධන සහනාධාරයක් ලබාදීමේ යෝජනාව ඉදිරිපත් කල ගරු පළාත් සභා මන්ත්‍රී ජගත් පල්ලියගුරු මහතාට සිය ස්තුතිය පළකරන බැව් පැවසීය.
තව දුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, ජාතියේ යුධ වීරයා ජෙනරාල් සරත් පොන්සේකා මහතා ඉතා අසාධාරණ ආකාරයට බන්ධනාගාරගත කර තිබුණු අතර, ඒ මහතා පසුගිය දා නිදහස් කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන්ට සිය ස්තුතිය පළකරන බව දැන්වීය.

රජය ජනතාවගේ ආර්ථික අපහසුතා නොසලකා ජීවන වියදම දැඩි ලෙස ඉහල නංවා ඇති බැව් පැවසීය. අද රටේ නීතිය යුක්තිය නැති බවත්, සෞඛ්‍ය, අධ්‍යාපනය, සංස්කෘතිය කෙරෙහි ද කිසිදු අවධානයක් යොමු නොවන බැව් පැවසීය. ජනතාවගේ ආර්ථික අපහසුතාවය නොසලකමින් මාර්ග පද්ධතිය පමණක් කොන්ක්‍රීට් කිරීමෙන් රටේ මන්ද බුද්ධිකයින් , රෝගීන් විශාල පිරිසක් බිහිවනු ඇතැයි ද වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූ අතර, රජය මීට වඩා වැඩි අවධානයකින් යුතුව කටයුතු කිරීම අවශ්‍ය බැව් දැන්වීය.

තව දුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, මෙම සභාව මගින් සංවර්ධන කටයුතු සඳහා ලබාදුන් රු.1,25000/- ක මුදලින් කිරිදිගල ප්‍රජාශාලාවේ පවත්වාගෙන යන ළදරු පාසලට සීසෝ එකක්, ඇල්ලෙපොල සුභ සාධක සමිතියට හට් 01 ක් හා ප්ලාස්ටික් පුටු 50 ක් ලබාදුන් අතර, ඊට අමතරව, දොරවෙල මාර්ගය දෙපස දැමීම සදහා බට 20 ක් ලබාදුන් බැව් පැවසූ අතර, මෙම කාර්යයන් සිදුකිරීමට මුදල් වෙන්කරදීම සම්බන්ධව මෙම සභාවේ ගරු සභාපතිතුමන් වෙත ස්තුතිය පළකරන බැව් පැවසීය.

14:02 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ මැතිතුමා විසින් කරන ලද ප්‍රකාශය සම්බන්ධව යම් කරුණු පැහැදිලි කිරීමක් කලයුතු බැව් දැන්වීය. වත්මන් එක්සත් ජනතා නිදහස් සංධාන රජය ජනතාවගේ සුභසාධනය උදෙසා ඉමහත් සේවයක් කරන බැව් පැවසීය. විවිධ වැඩ සටහන් හරහා ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය කරමින්, කෘෂිකර්මාන්තය නඟාසිටුවීම, හෝටල් පද්ධතිය ඉදිකරමින්, සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම, රෝහල් පද්ධතිය දියුණු කරමින් සෞඛ්‍ය ක්ෂේත්‍රය නගා සිටුවීම, ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් වෙත අධ්‍යාපන ක්ෂේත්‍රය යොමුකිරීම ඇතුළු සුවිශාල සේවාවන් රැසක් ඉටුකිරීමට රජය කටයුතු කර ඇති බැව් පැවසීය. එසේම රටේ විශාල ආගමික නවෝදයක් ද ඇති වී තිබෙන බවද වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසීය. රට සෑම අතින් සංවර්ධනය වී ඇති අතර, එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ඉටුකරන මෙහෙවර නිරන්තරව අගය කලයුතු අතර, අප සෑම විටම මෙම වැඩ සටහන් වලට අවශ්‍ය සහයෝගයන් ලබාදීම අපගේ යුතුකම යැයි පැවසීය.

- ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ දයාබර මාමණ්ඩිය අභාවප්‍රාප්ත වූ බැවින් , ඒ සම්බන්ධව සභාවේ ශෝකය එතුමා ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යැවීමට යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

14:03 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ජේ.මලීක්ෂා මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, මෙම සභාව මගින් වෙන්කර දුන් රු.1,25000/- ක මුදලින් කිරිමණ්ඩලය අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීමට කටයුතු කල බවත්, ඒ සම්බන්ධව තමා ඇතුළු ප්‍රදේශවාසීන්ගේ විශේෂ ස්තුතිය ගරු සභාපතිතුමන් වෙත පළකරන බව පළමුවෙන්ම පැවසීය.

මොහාන් එල්ලාවල මාවතේ කුණු කසල ඉවත් කිරීම නිසි පරිදි සිදුනොවන බැවින්, ඒ කෙරෙහි අදාල නිලධාරීන්ගේ අවධානය යොමුකර එම ප්‍රදේශයේ පවිත්‍රතා කටයුතු මැනවින් පවත්වාගෙන යන ලෙස ඉල්ලීමක් කරන ලදී.

14. **අවසානය :-**

**ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

ගරු සභාපතිතුමා කථා කරමින්, අපේ රට කිසිදු රටකට අත නොපා ජීවත්වීමට රට ස්වංපෝෂිත කිරීමට විවිධ වැඩ සටහන් මේවන විට ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කර ඇති බැව් පැවසීය. අතිගරු ජනාධිපතිතුමා මේ රට භාරගන්නා අවස්ථාවේ දී රටතුළ ප්‍රශ්ණ රාශියක් තිබුණු බවත්, එදා ප්‍රධානතම අභියෝගයක් බවට පත්ව තිබූ කොටි ත්‍රස්තවාදය තුරන් කර සාමය ළඟා කර බියෙන් සැකෙන් තොරව ජීවත්වීමට හැකියාව ලබාදී ඇති බැව් පැවසීය. මහින්ද චින්තනය තුළින් රට සංවර්ධනය කිරීමට කටයුතු කර තිබෙන බවත්, මහා පරිමාණ වැඩ ආරම්භ කර ඇති බවත් පැවසීය. විදුලි ජනන බලාගාර සෑදීම, රට පුරා ජාත්‍යන්තර වරායවල් සෑදීම, ගුවන් තොටුපලවල් නිර්මාණය කිරීම, සංචාරක කර්මාන්තය දියුණු කිරීම , ග්‍රාමීය මාර්ග පද්ධති , අධිවේගී මාර්ග පද්ධති සකස් කිරීම යටිතල පහසුකම් දියුණු කිරීමට කටයුතු කර ඇති බැව් පැවසීය. මේ අනුව රට සෑම අතින් දියුණු වී ඇති බැව් සඳහන් කල අතර, එක්සත් ජාතික පක්ෂය නිරන්තරව ගැටුම් ඇතිකරගෙන නායකයා හැල්ලුවකට ලක්කරමින් කටයුතු කරන බැව් පැවසීය. ඒ ආකාරයට එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය කටයුතු නොකරන බවත්, අප සෑම විටම පක්ෂයේ නායකතුමාට ගරු කරමින් රජයේ කටයුතු සාර්ථකය කරගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන බැව් පවසමින්, අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව නිමකිරීමට දායක වූ ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට සිය ස්තුතිය පළකරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.2.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.